# ගම නැගුමට සැලසුම්කරුවන් පුහුණු කිරීමේ පුරෝගාමියා

ශ්‍රී ලංකාව ග්‍රාමීය ආර්ථිකයක් සහිත රටකි. ලොව පිළිගත් සංවර්ධන ප්‍රවේශයක් වන ජනතා සහභාගීත්ව ප්‍රවේශය මත ජනතාව කේන්ද්‍ර කොට ගත් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීම හා කළමනාකරණය සඳහා ප්‍රජා සහභාගීත්ව ක්‍රමවේදය භාවිතා කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ පුහුණු වැඩසටහන් අතර ප්‍රමුඛතම වැඩසටහනකි. මෙම ආයතනය රටේ සංවර්ධනය වෙනුවෙන් ක්‍රියා කිරීමේ තවත් සුවිශේෂී ක්ෂේත්‍රයක් ලෙස ශ්‍රී ලංකාවේ ග්‍රාමීය සංවර්ධන ක්ෂේත්‍රයේ නිලධාරීන් අතර කීර්තියක් දිනා ඇති වැඩසටහනක් වන සහභාගීත්ව සංවර්ධන විධික්‍රම පිළිබඳ ව පුහුණු වැඩසටහන පිළිබඳව සිදු කෙරෙන විවරණයක් මෙම ලිපියෙන් සිදු කෙරේ.

## පසුබිම

ශ්‍රී ලංකාවේ ග්‍රාමීය අංශය යනු ශක්‍යතාවයන් රැසකින් හෙබි අතිශය දීප්තිමත් ක්ෂේත්‍රයකි. එසේ වුව ද, වර්ධනය වන ජනගහනය හා ගෝලීය ආර්ථික බලපෑම හමුවේ එහි ගතිකත්වය අර්බුදකාරී දිශානතියකට යොමු වී පවතී. ඒ අනුව, තීව්‍රවෙමින් පවතින දරිද්‍රතාවය, ණයගැති භාවය, ඉඩම් හිඟය, ඉඩම් අයිතිය පිළිබඳ ගැටළු, සාම්ප්‍රදායික වගා ක්‍රම, යටිතල පහසුකම්වල හිඟය, අලෙවිකරණ ගැටළු, වන සත්ත්ව උවදුරු ආදී ගැටළු නිර්මාණය වෙමින් තිබේ.

ශ්‍රී ලංකා ආර්ථිකයේ වර්තමානයේ දක්නට ඇති ස්වරූපය මහින්ද චින්තන දස අවුරුදු දැක්ම තුළ අවධානයට යොමු වී ඇති අතර ඒ පහත ආකාරයෙන් දක්වා ඇත. පසුගිය දශක තුනක් තිස්සේ ශ්‍රී ලංකාවේ පැවතියේ සාමාන්‍ය මට්ටමේ ආර්ථික වර්ධනයකි. අග්නිදිග ආසියාවේ නැගී එන ආර්ථිකයන් හි වර්ධන අනුපාතය සලකා බලන කළ ශ්‍රී ලංකාව පසුපසින් සිටී. අතීතයේ සිදු වූ ආර්ථික වර්ධනයන් හි ප්‍රතිලාභ ග්‍රාමීය ක්ෂේත්‍රයට අහිමි වී ඇති බැව් මූලික වශයෙන් පැහැදිළි ය. එබැවින් නැගී එන ආර්ථිකයක් ලෙස ස්වකීය ආර්ථික කලාපය තහවුරු කරගැනීම පිණිස ශ්‍රී ලංකාවට සීඝ්‍ර වර්ධනයක් අවශ්‍ය වනුවා මෙන් ම අති දිළිඳු කණ්ඩායම් ද ඇතුළුව රටේ සියළු පුරවැසියන් සඳහා යහපත් ජීවන තත්ත්වය ද සහතික කළ යුතු ව ඇත(මහින්ද චින්තන දස අවුරුදු දැක්ම).

මෙම දස අවුරුදු වැඩසටහනේ අපේක්ෂිත සීඝ්‍ර වර්ධනයක් සමග වර්ෂ 2016 වන විට ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදනය රුපියල් 485000 දක්වා ඉහළ නැංවෙනු ඇත. ආර්ථිකය 8% ක වාර්ෂික වර්ධනයකින් ඉහළ නැගෙතැයි අපේක්ෂා කළ හැකි ය. ලොව මධ්‍යම ආදායම් සහිත රටවල් කාණ්ඩ තුළට ශ්‍රී ලංකාව ද ඇතුළත් වීමේ හැකියාව ද පවතී.

මෙම අපේක්ෂිත ඉදිරි පිම්ම සාර්ථකව පැනීම සඳහා වර්තමාන ශ්‍රී ලංකාවේ අමාත්‍යාංශ හා ඒ යටතේ පවතින දෙපාර්තමේන්තුවලට ඉලක්ක සහිත වැඩසටහන් සකස් කර ක්‍රියාවට නැගීමට සිදු වේ.

කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ පවතින හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයට මෙම කාර්යයේ දී සුවිශේෂී වගකීමක් පැවරේ. මෙම ආයතනයට එය ඉටු කිරීම සඳහා පනතින් බලය පැවරී තිබේ. එනම්, ග්‍රාමීය ගොවිජන අංශයේ පර්යේෂණ හා පුහුණු තුළින් ග්‍රාමීය අංශය සංවර්ධනය කිරීම යි. මෙම ආයතනයේ දැක්ම වී ඇත්තේ ද තිරසාර ගොවිජන හා ග්‍රාමීය සංවර්ධනය සඳහා දැනුම ජනනය කර ලබාදීමේ ප්‍රමුඛයා වීම යි.

## මෙම කාර්යය ඉටු කිරීමේ දී හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය සතු ශක්තීන්

පළපුරුදු දක්ෂ පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරී කාර්ය මණ්ඩලයක් ආයතනය සතු වේ. උපාධි සහ පශ්චාත් උපාධි හැදෑරීමෙන් ලබා ගත් දැනුමට අමතරව දීර්ඝ කාලයක් පර්යේෂණ කටයුතුවල නියැළීමෙන් ලබාගත් පුළුල් දැනුමක් ඔවුන් සතු ය. සන්නිවේදනය සඳහා නවීන ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ ආයතනය සතුව පවතී.

## පුහුණු වැඩසටහන්

ගොවිජන පර්යේෂණ කටයුතුවලට අමතරව පුහුණු කටයුතු ද ප්‍රමුඛතම කාර්යයකි. ආයතනය විසින් වර්තමානයේ ක්‍රියාවට නගනු ලබන පුහුණු කටයුතු

අතර ග්‍රාමීය නායකත්ව පුහුණුව, ගොවි සංවිධාන සවිබල ගැන්වීම, සමාජ සජීවීකරණය, සහභාගීත්ව ශිල්ප ක්‍රම භාවිතයෙන් ප්‍රජා සංවර්ධන සැලසුම්කරණය වැනි පුහුණු කටයුතු කැපී පෙනේ.

**ජනතා සහභාගීත්ව ක්‍රමෝපායයන් කේන්ද්‍ර කරගත් ප්‍රජා සංවර්ධන සැලසුම් සහ කළමනාකරණය සඳහා වූ පුහුණු වැඩසටහන්**

වර්තමානයේ ග්‍රාමීය ජනගහනය වැඩිවීමේ ප්‍රතිඵලයක් ලෙස ග්‍රාම නිලධාරී කොට්ඨාස අලුතින් තීරණය වීම නිසා 2006 වර්ෂය වන විට ශ්‍රී ලංකාවේ ගම්මාන සංඛ්‍යාව 35967 (විමලරත්න හිමි, 2009) දක්වා වර්ධනය වී තිබේ. ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 75% තරම් වූ පිරිසක් ජීවත් වන්නේ ග්‍රාමීය අංශයේ බැවින් ද, මුල දී සඳහන් කළ විවිධ වූ ශක්‍යතාවයන් ග්‍රාමීය අංශය තුළ පවතින හෙයින් ද, ඉහළ ආර්ථික වෘද්ධියක් ඉදිරි වසර කිහිපය තුළ අපේක්ෂා කරන බැවින් ද, ග්‍රාමීය ආර්ථිකය සංවර්ධනය කිරීමේ කාර්යයට අත ගසා ඇත. මෙම "ගම නැගුම" ව්‍යාපෘතිය නමින් මෙය හඳුන්වනු ලබයි.

**පුහුණු වැඩසටහනෙ හි ඇති වැදගත්කම**

ග්‍රාමීය හා ප්‍රජා සංවර්ධන ක්‍රියාවලියේ දී ප්‍රජා සහභාගීත්වය ලබා ගත යුතු යැයි යන සංකල්පය වර්තමානයේ දී ඉතාමත් වැදගත් ලෙසින් මතුව ඇති කරුණකි. තව ද, තිරසාර සංවර්ධනයේ දී ප්‍රජා සංවර්ධනය හා සම්බන්ධ වැඩසටහන් සඳහා අත්‍යවශ්‍ය වූ අංගයක් ලෙස සහභාගීත්වය යන්න සංවර්ධනය වන රටවල රජයන් විසින් මහත් උනන්දුවකින් පිළිගෙන ඇත. එබැවින් විවිධ සංවර්ධන වැඩසටහන් මෙන් ම ව්‍යාපෘතීන් හා සම්බන්ධ සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, ප්‍රගති සමාලෝචනය හා ඇගයීම් කිරීම, ජනතා සහභාගීත්ව සංවර්ධන ප්‍රවේශය නම් වේ. ග්‍රාමීය ප්‍රජා කටයුතුවල දී අදාළ ගම්වල තොරතුරු රැස් කිරීම සඳහාත්, එම සංවර්ධන කටයුතු සඳහා පහසුකම් සලසන ආයතන හා ප්‍රජාවන් අතර ක්‍රමවත් හා නිසි සන්නිවේදන ක්‍රියාවලියක් ගොඩනැගීම සඳහාත්, වඩාත් උචිත ප්‍රයෝගයක් ලෙස කඩිනම් ගැමි පිවිසුම් ක්‍රමය (Rapid Rural Appraisal / RRA) හා සහභාගීත්ව ගැමි පිවිසුම (Participatory Rural Appraisal/PRA) යන විධි ක්‍රම මෑතක දී වඩාත් ජනප්‍රිය ඒවා බවට පත් වී තිබේ. ව්‍යාපෘති චක්‍රීය කළමනාකරණය (Project Cycle Manegement /PCM) යන විධි ක්‍රමය ව්‍යාපෘති සැලසුම්කරණයේ දී එකිනෙක අංශ අතර වූ තාර්කික සම්බන්ධතාවයක් මැනවින් මතු කර පෙන්වයි. මෙම විධි ක්‍රමය භාවිතා කෙරෙන ව්‍යාපෘති චක්‍රීය කළමනාකරණ වැඩමුළු මඟින් ජනතාව ක්‍රියාකාරී ලෙස සැලසුම්කරණය සඳහා සහභාගී කරවා ගැනීමට අවස්ථාව සැලසේ. එම නිසා, කඩිනම් ගැමි පිවිසුම් ක්‍රමය හා සහභාගීත්ව ගැමි පිවිසුම් ක්‍රමය හා ව්‍යාපෘති චක්‍රීය කළමනාකරණය යන ක්‍රමවේදයන් පිළිබඳව න්‍යායාත්මක මෙන් ම ප්‍රායෝගික දැනුමක් අදාළ නිලධාරීන් වෙත ලබාදීම යුගයේ අවශ්‍යතාවයක් වී තිබේ.

**මෙම පුහුණු වැඩසටහනෙ හි ප්‍රධාන අරමුණු**

1. පුහුණුලාභීන්ට ග්‍රාමීය ප්‍රජා සංවර්ධන කටයුතුවල දී ප්‍රජා සහභාගීත්වය ලබා ගැනීමේ ඇති වැදගත්කම හා ඒ සඳහා භාවිතා කළ යුතු විධික්‍රම පිළිබඳව න්‍යායාත්මකව දැනුමක් ලබා දීම.
2. ග්‍රාමීය ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම. භාවිතා කළ හැකි සහභාගීත්ව විධි ක්‍රම වන කඩිනම් ගැමි පිවිසුම් ක්‍රමය, සහභාගීත්ව ගැමි පිවිසුම් ක්‍රම හා ව්‍යාපෘති චක්‍ර කළමනාකරණය යනා දී ක්‍රම භාවිතා කිරීම පිළිබඳ සහභාගී වන්නන් තුළ කුසලතා වර්ධනය කිරීම.

**පුහුණු වැඩසටහන් විශේෂිත අරමුණු වශයෙන් ගත් කළ වැඩසටහන අවසානයේ දී පුහුණුලාභීන් හට පහත සඳහන් කාර්යයන් ඉටු කිරීමට හැකියාව ලැබේ.**

1. සහභාගීත්වය සංකල්පය හා සැලසුම් සැකසීමේ දී මෙන් ම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී ද එහි ඇති වැදගත්කම පිළිබඳව පැහැදිළි කිරීම.
2. කඩිනම් ගැමි පිවිසුම හා සහභාගීත්ව ගැමි පිවිසුම යන ක්‍රමවේදයන් නිර්වචනය කිරීම.
3. කඩිනම් ගැමි පිවිසුම හා සහභාගීත්ව ගැමි පිවිසුම යන ක්‍රමවේදයන්ට අදාළ මූලධර්ම හා ඒවා ක්‍රියාත්මක කිරීමේ දී අනුගමනය කළ යුතු පියවර පිළිබඳව පැහැදිලි කිරීම
4. කඩිනම් ගැමි පිවිසුම් ක්‍රමය හා සහභාගීත්ව ගැමි පිවිසුම් ක්‍රමය යන ක්‍රමවේදවල දී භාවිතා කළ හැකි හා තොරතුරු රැස් කිරීමේ ක්‍රම නම් කිරීමට, විස්තර කිරීමට හා ඒවා භාවිතා කර පෙන්වීම.
5. සහභාගීත්ව ව්‍යාපෘතියේ චක්‍රීය කළමනාකරණය (PPCM)යන සංකල්පය පැහැදිලි කිරීම.

6. ගැටළු ගස (problem tree) අරමුණු ගස (objective tree) ව්‍යාපෘති සැලසුම් න්‍යායකරණය (Project Planing Melhodlogy) යන්න පිළිබඳව පැහැදිලි කිරීමට හා ග්‍රාමීය/ප්‍රජා සැලසුම්කරණය සඳහා භාවිතා කර පෙන්වීම.

**පුහුණු වැඩසටහනට සහභාගී කරගන්නන්**

මෙම පුහුණු වැඩසටහන සඳහා සහභාගී කර ගනුයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සංවර්ධන නිලධාරීන් හා සැලසුම් නිලධාරීන්, ගොවිජන සංවර්ධන ක්ෂේත්‍රයේ හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ය. එසේ වුව ද ග්‍රාමීය සංවර්ධන කාර්යයේ නියැළෙන ඕනෑ ම රාජ්‍ය හෝ රාජ්‍ය නො වන ආයතන සේවයේ යෙදී සිටින පුද්ගලයෙකුට මෙම පුහුණු වැඩසටහන මහෝපකාරී වේ.

**නිගමනය**

මහින්ද චින්තන දස අවුරුදු සැලැස්මේ සඳහන් කර ඇති ආකාරයට රටේ සුරක්ෂිතතාවයත් කුඩා ගොවීන්ගේ ආදායම් නැංවීමත්, නූතන තාක්ෂණය භාවිතයෙන් ගොවිපොළ භාවිතය ඉහළ නැංවීමත්, වාණිජ කෘෂිකර්මය වෙත ගොවීන් යොමු කිරීමත්, කෘෂිකර්ම ක්ෂේත්‍රයේ ඵලදායීතාවය නැංවීම සඳහා වන ක්‍රමෝපායයන් වේ. එසේ ම, ග්‍රාමීය ප්‍රදේශවල මූලික යටිතල පහසුකම් හා අනෙකුත් සේවා සංවර්ධනය කිරීම, විදුලි සැපයුම විදුලි සංදේශ සේවා, වාරි ජල සම්පාදනය, පානීය ජල සම්පාදනය, ප්‍රවේශ මාර්ග, ගබඩා පහසුකම් ප්‍රාදේශීය සංවර්ධනයේ ප්‍රමුඛත්වයට පත් වී තිබේ.

මෙම දස අවුරුදු සැලසුමට සාර්ථක ලෙස ළඟාවීම පිණිස මෙම ක්ෂේත්‍රයේ සෘජුවම යෙදී සිටින ක්ෂේත්‍ර නිලධාරීන්, සැලසුම් සම්පාදකයන්, ව්‍යාපෘති හඳුනා ගැනීම හා ක්‍රියාත්මක කිරීම, ඒවා ඇගයීම ආදිය පිළිබඳව පූර්ණ දැනුමක් අවශ්‍ය ය. මෙම ක්‍රියාවලිය ජනතාව කේන්ද්‍ර කරගනිමින් සහභාගීත්ව ප්‍රවේශය ආශ්‍රයෙන් සිදු කිරීම මෙම ක්‍රියාවලියේ තිරසාරභාවයට හේතු වේ.

සහභාගීත්ව ප්‍රවේශය පිළිබඳ ව පුහුණු වැඩසටහන් සියයකට කිට්ටු සංඛ්‍යාවක් පැවැත්වීම මගින් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය දස අවුරුදු රාජ්‍ය ප්‍රතිපත්තිය සාර්ථක කරගැනීම සඳහා අවශ්‍ය මානව සම්පත සංවර්ධනය කිරීමේ කාර්යභාරය මැනවින් ඉටු කිරීම යුගයේ අවශ්‍යතාවය ඉටු කිරීමක් සේ වැඩිදුරටත් සඳහන් කළ හැකි ය.


**ආර්.එල්.එන්. ජයතිස්ස**

*සහාය අධි පර්යේෂක*
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය.


**ගොවිතැනට භාවිත පැරණි උපකරණ**

| | | |
|---|---|---|
| සිංහල උදැල්ල | - | මෙම උදැල්ල නියර, වක්කඩ, කමත වැනි තැන් සෑහීමට ගනී. පුරන් උදලු, දෙමේ උදලු, සමනළ උදලු ආදී වශයෙන් උදලු වර්ග 16 ක් අතීතයේ පැවති බව වාර්තා වේ. |
| වප් පෙට්ටිය | - | වී වැපිරීම පිණිස ගන්නා බඳුනකි. වට පෙට්ටිය යන නම ද භාවිත වේ. |
| කලල් පෝරුව | - | මඩ කළ ලියදි මට්ටම් කිරීම පිණිස ගවයන් ලවා අද්දවනු ලබන මෙවලමකි. |
| අත් පෝරුව | - | මඩ කළ ලියදි මට්ටම් කිරීම පිණිස භාවිත කරන අත් මෙවලමකි. "කර පෝරුව" යනු තවත් නමකි. |
| කුල්ල | - | යතුරු කුල්ල යනුවෙන් හඳුන්වනු ලබන මෙය බත සුළං කිරීම පිණිස භාවිත කෙරේ. කුල්ලට කමත් බස 'යතුර' යන්න ය. |